**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව - 2021**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.5,900,625 ක්වූ වාහන 02ක් හා කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ වල ඵලදායි ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මයික්‍රෝ වාහනය (රු.3,173,333) භාවිතා කළ නොහැකි අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නිර්දේශය අනුව ක්‍රියා කරනු ඇත. YL1947 ත්‍රීරෝද රථය අලුත්වැඩියා කිරීම ආරම්භ කර ඇත. මෙම වසරේ දී එය ප්‍රතිශෝධනය කරනු ලැබේ .කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ ප්‍රතිශෝධනය කිරීමට විශාල මුදලක් වැය වන හෙයින් එසේ නොකර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන 04 ක් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇති වී තිබූ ප්‍රත්‍යාගණන ලාභය රු.1,900,000 ක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කරනු වෙනුවට වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩුකර දක්වා තිබීම නිසා වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් ද ප්‍රත්‍යාගණන සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | රු.1,900,000 ක ලාභය ප්‍රත්‍යාගණන සංචිතයට එකතු කර ක්ෂය වියදම මෙම වර්ෂයේ වෙනස් කරනු ලැබේ. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන්ව තිබූ මෝටර් බයිසිකල් 02 ක ප්‍රත්‍යාගණන වටිනාකම රු.500,000 ක් අදාල වත්කම් ගිණුමට හරකර ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කළ යුතු | මෙම වසරේ දි මෙම වරද නිවැරදි කරනු ලැබේ. | ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | වූවත්, ක්ෂය ගිණුමට හර කර, ක්ෂය වෙන් කිරීම ගිණුමට බැර කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය සහ වත්කම් වල ශුද්ධ අගය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | වාහන 03 ක පිරිවැය හා ප්‍රත්‍යාගණන අගය යන දෙකම වාහන වල පිරිවැය ලෙස සැලකීම හේතුවෙන් ස්ථාවර වත්කම් ශේෂය රු.5,700,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම වෙනස මෙම වර්ෂයේ නිවැරදි කරනු ඇත. | ස්ථාවර වත්කම්වල පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ14 (3) වගන්තිය | 2019, 2020 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තා 2022 අප්‍රේල් මාසය අවසන් වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වාර්ෂික වාර්තාව කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යොමු කිරීම සඳහා 2022.01.05 දින අධිකරණ අමාත්‍යාංශයට යවා ඇත. 2020 වාර්ෂික වාර්තාව කැබිනට් මණ්ඩල අනුමැතියට යොමු කිරීමට කටයුතු සිදු කරමින් පවති. | මුදල් පනතේ 14 (3) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1982 අංක 43 දරන මුද්දර බදු පනත | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අයකල යුතු වූවත් රු.691,190 ක ගෙවීම් සඳහා වූ වවුචර්පත් 14 කට අදාල මුද්දර ගාස්තු අයකර නොතිබුණි. . | මේ සම්බන්ධයෙන් සෑම මධ්‍යස්ථානයක් වෙතම දන්වා ඇත. | 1982 අංක 43 දරන මුද්දර බදු පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12/දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබා නොගෙන කොමිෂන් සභාවේ සේවකයන් වෙනුවෙන් 2015 වර්ෂයේදී පෞද්ගලික රක්ෂණ ක්‍රමයක් ආරම්භ කර සමාලෝචිත වර්ෂය සඳහා සේවකයන් 56 දෙනෙකු වෙනුවෙන් රක්ෂණ දායකයෙන් සියයට 50 ක් වූ රු1,466,321.ක් පෞද්ගලික රක්ෂණ සමාගමක් වෙත ගෙවා තිබුණි. | මේ සම්බන්ධව අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය ප්‍රකාරව අදාල අනුමැතිය ලබා ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,754,042ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.21,323,099 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,569,057 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 27 දරන නීති ආධාර කොමිෂන් සභා පනතේ, 4(එ) ඡේදයේ සඳහන් නීති ආධාර සැපයීමෙහිලා වූ යම් අංශයක් සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩසටහන්, නීති ගැටළු මධ්‍යස්ථාන හා ව්‍යාපෘති පිහිටුවීම පාලනය කිරීම, සංවර්ධනය කිරීම හා ඒවාට සහයෝගය දැක්වීම හා ඒ කාර්ය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ඇතිකිරීම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යය කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීම යන ප්‍රධාන බලතල මෙතෙක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | රාජ්‍ය නීති ආධාර වැඩපිළිවෙල සිවිල් සමාජය තුල විධිමත්ව බලගැන්විමක් සිදු කිරීමේ අරමුණින් 2016 මාර්තු 30 ශ්‍රී ලංකාව සඳහා යෝජිත නීති ආධාර ප්‍රතිපත්තිය නමින් වූ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නීති ආධාර වැඩසටහන් නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නීති ආධාර සැපයිම සඳහා 2020 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාව 36,567 ක් වූ අතර 2020 වර්ෂයේ අළුතින් ගොනු කරන ලද නඩු 8,075 ක් ද සමඟ කටයුතු කිරීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 44,642 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ නඩු 6,543 ක් නිරවුල් කිරීම සඳහා නීතිඥ සහය (නීති ආධාර) ලබාදී | අධිකරණ කටයුතු හුදකලාව සිදු කළ නොහැකි ක්‍රියාවලියකි. නඩු ප්‍රමාදය සමස්ථ අධිකරණ පද්ධතියටම බලපාන කරුණක් වන අතර නීති ආධාර කොමිෂන් සභාවේ පවත්නා නඩු වලින් සියයට 56 ක්ම නඩත්තු නඩු වේ. නඩත්තු නඩුවක් අනිවාර්යයෙන් | පනතේ අරමුණු ඉටු කිරීම සඳහා කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට නඩු 38,099 ක් ඉතිරි වී තිබුණි. එය සේවා සැපයීමට තිබූ මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 85 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | දරුවන්ට අවුරුදු 18 සම්පූර්ණ වනතෙක් ද, අධ්‍යාපනය ලබන දරුවන් සම්බන්ධයෙන් උපරිම වයස 25 දක්වාද වන තුරු පවත්වාගෙන යා යුතුය. එසේම පාර්ශවයන් අතර දික්කසාද තීන්දුවක් ලබාගන්නා තුරු ද නඩත්තු නඩු පවත්වාගෙන යා යුතුය. එහෙයින් නඩු අවසන් කිරීමේ දත්ත සම්බන්ධයෙන් එම කරුණ ඉතා දැඩිව බලපායි. | |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවේ අළුත්කඩේ ශාඛාවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමේ 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 පුරාම රු.මිලියන 1.8 ත් රු.මිලියන 8.7 ත් අතර මුදලක් නිෂ්කාර්යව පැවතුණ ද, එම මුදල් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අරමුදල් සැලසුම් කිරීම සහ උපයෝජනය කිරීම කාර්යක්ෂම අයුරින් සිදු කළ යුතු වේ. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4(2) හා 4(2)(2) වගන්ති ප්‍රකාරව සකස් කල යුතු අවම වශයෙන් වසර 3ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | මින් ඉදිරියට අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි . | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 27 ක් ද්විතිය මට්ටමේ පුරප්පාඩු 02 ක්ද, තෘතිය මට්ටමේ පුරප්පාඩු 18 ක්ද, ප්‍රාථමික මට්ටමේ 32 ක්ද, වශයෙන් පුරප්පාඩු 76 ක් පැවතුණ අතර මෙම පුරප්පාඩු කොමිෂන් සභාවේ කාර්යන් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සෘජුව බලපා තිබුණි. | පිළිතුරු සපයා නැත. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නීති ආධාර කොමිෂන් සභාවේ සේවයකල නිලධාරීන් දෙදෙනකු විදේශ ගත වී වසර 2 කට පෙර සේවයට වාර්තාකල යුතු වුවද එසේ වාර්තා කර නොතිබූ බැවින් ඔවුන්ගෙන් අයකරගත යුතු රු.844,056 ක බැඳුම්කර මුදල් ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 4:7 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් ගෙවන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර මුදල් අයකර ගත යුතු වේ. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**
-----------------------------------------

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**
---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් විය යුතු ප්‍රමුඛතාවය අනුව මාසික පදනමින් ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ඉදිරිපත් කර නොතිබූ අතර දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධයෙන් ඉලක්ක සකස් කර කාර්යසාධනය ගණනය කර නොතිබුණි | ක්‍රියාකාරී සැලැස්මේ කාර්තු මත පදනම්ව ඉලක්ක ඉදිරිපත් කර ඇත . ඉදිරියේ දී මාසික පදනමින් ඉලක්ක ඇතුලත් කිරීමට කටයුතු කරමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතු අතර අදාල ක්‍රියාකාරකම් සඳහා ඉලක්ක හඳුනාගෙන කාර්යසාධනය ගණනය කල යුතු වේ. |

**4.2 තිරසර සංවර්ධනය**
-------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගෙන ඒවා අවම කිරීමට ගතයුතු පියවරයන් වශයෙන් නිසි ක්‍රම සම්පාදන සැලැස්මක් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය පිලියම් හා තීරණ ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබුණ ද එය සිදුකර නොතිබුණි. | මේ වන විට එම කමිටුව නම්කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී . | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |